(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 1(3).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2015 ඔක්තෝබර් මස 30 වැනි සිකුරාදා

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 152/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු කරුණාරත්න පරණවිතාන මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට අනුෂංගික කරුණු විමර්ශනය කර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුටම ඡන්ද අයිතිය තිබීම මූලික මිනිස් අයිතිවාසිකමක් හෙයින් ද;

විදේශගතව රැකියාවන්හි යෙදෙන ශ්‍රී ලාංකීය පුරවැසියන් හට මෙරට පවත්වන මැතිවරණ සඳහා ඡන්දය භාවිතා කිරීමේ අවස්ථාවක් මෙතෙක් නොලැබී ඇති හෙයින් ද;

විදේශගතව රැකියා කරන ශ්‍රී ලාංකිකයන්, ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථිකය පවත්වාගෙන යාමට විදේශ විනිමය ඉපයීමෙන් මහඟු දායකත්වයක් සපයන හෙයින් ද;

විදේශ රැකියා නියුක්තිකයන්ට ගෞරවාන්විතව රැකියා කටයුතු කර ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම රජයේ වගකීමක් වන හෙයින්;

මැතිවරණයකදී ඡන්දය භාවිතා කිරීම විදේශගතව රැකියා කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකමක් වන හෙයින් ද; සහ

විදේශගතව රැකියාවන්හි යෙදෙන ශ්‍රී ලාංකිකයින්ට මුහුණ පෑමට සිදුව ඇති දුෂ්කරතාවයන් සහ ඔවුන්ට මැතිවරණයකදී ඡන්දය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශයන් සහිතව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට හැකිවන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් නම් කළ යුතු ය.

   (ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට,

   (අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

   (ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

   (ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ප්‍රතිඥා හෝ දිවුරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

   (ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සහාය ලබා ගැනීමට; සහ

   (ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

   බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස හයක (06) කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබාදෙන අන් කවර කාල සීමාවක් තුළ හෝ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.